www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නැගෙනහිර ටිමෝරයේ ඕස්ට්‍රේලියානු නව විජිත ග්‍රහනයට එරෙහි වනු

## Oppose Australia's neo-colonial occupation of East Timor

**ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය**

**2006 ජුනි 01**

සමාජවාදී සමානතා පක්ෂය, අසල්වැසි කුඩා රාජ්‍යයක් වන නැගෙනහිර ටිමෝරයට හොවාර්ඩ් ආන්ඩුව කල මිලිටරි ආක්‍රමනයට එකහෙලා විරුද්ධත්වය පල කරයි. ප්‍රහාරක හෙලිකොප්ටර්, යුද නැව් හා සන්නද්ධ රථවලින් පිටුබලය ලත් සන්නද්ධ හමුදාවන් පිටත් කර හැරීම ආසියා-පැසිෆික් කලාපයෙහි ඕස්ට්‍රේලියානු අධිරාජ්‍යවාදයේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන් ආරක්ෂා කිරීමේ එල්ලය සහිත බිය ගැන්වීමේ හා ආක්‍රමනකාරීත්වයේ නග්න නව විජිතවාදී ක්‍රියාවකි.

1,300කින් සමන්විත හමුදා බලඇනිය දැනට මත් නැගෙනහිර ටිමෝරයේ ඩිලී අගනුවර තම ග්‍රහනයට ගෙන රටේ බිඳ වැටී ඇති ආරක්ෂක හමුදාවල තැන අත්පත් කර ගෙන සිටියි. ඉරාකය යටත් කිරීමේ දී මුවහත් කල විධික්‍රම යොදා ගනිමින් ඕස්ට්‍රේලියානු හමුදාව යුද නීතියට සමාන තත්වයක් ප්‍රකාශ කර තිබේ. නැගෙනහිර ටිමෝර බලධාරීන්ට නො දන්වා ඕනෑ ම අයෙකු අත් අඩංගුවට ගෙන අනියත කාලයක් රඳවා ගැනීමේ පුලුල් බලතල සොල්දාදුවන්ට හිමිව තිබේ.

කැන්බරාව තමන්ට අවශ්‍ය වන්නේ අගමැති මාරි අල්කැටරි, තම අවශ්‍යතාවන්ට වඩාත් නම්‍යශීලී වන අයෙක් මගින් ඉවත් කිරීම බව වසං කර ඇත්තේ මද වශයෙනි. ඕස්ට්‍රේලියානු අගමැති හොවාර්ඩ් නැගෙනහිර ටිමෝරය ''හොඳින් පාලනය කර නැතැ'' යි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇත. මැයි 30 දින මර්ඩොක්ගේ ඕස්ට්‍රේලියන් පුවත් පතෙහි කතුවැකියෙන් අල්කැටිරි අපකීර්තිමත්, උද්ධච්ච, දූෂිතයෙකු හා මාක්ස්වාදියෙකු ද ලෙස හැඳින් වූ අතර, රටේ කන්ඩායම්ක අරගල හා භීෂනයට ඔහුට චෝදනා නගමින්, නව අගමැතිවරයෙක් තෝරා ගත යුතු බව එක එල්ලේ කියා සිටියි.

ඕස්ට්‍රේලියානු හමුදාවන්ට නාමිකව ''ආරාධනය කලේ අල්කැටිරි ආන්ඩුව ය යන කාරනය නා තකා ම, හොවාර්ඩ් සන්නද්ධ කැරලිකරුවන්ට එරෙහිව එයට සහාය දැක්වීම ප්‍රතික්ෂේප කලේ, ''මධ්‍යස්ථ භාවයේ'' ප්‍රෝඩාකාරී ආවරනය යටතේ ය. ''වැටලීමේ තත්වයක්'' ප්‍රකාශ කරමින් ද ආරක්ෂක හමුදාවන්ගේ සම්පූර්න පාලනය සියතට ගැනීමට උත්සාහ කරමින් ද නැගෙනහිර ටිමෝරයේ ජනාධිපති සනානා ගුස්මාවෝගේ අල්කැටිරි හුදෙකලා කිරීමේ ව්‍යායාමයට තිරය පිටුපසින් ඕස්ට්‍රේලියාව නිහඬව සහාය දැක්වී ය. අල්කැටිර්ට ආදේශකයෙකු පත් කරන්නේ ද යන ප්‍රශ්නය ගැන නො ව, කැන්බරාව උනන්දු වන්නේ ඒ කවදා ද යන්න ගැන ය.

සත්තකින් ම අල්කැටිරි මාක්ස්වාදියෙකු නො වේ. විධිමත් ලෙස නිදහස ලත් 2002 වසරේ පටන් එය පාලනය කර ඇති ඩිලීහි කුඩා පාලන ප්‍රභූව අතර සිටින ඔහුගේ එදිරිවාදීන්ට වඩා කිසි ලෙසකින් හෝ ඔහු නැගෙනහිර සාමාන්‍ය ටිමෝර වාසීන්ගේ බලාපොරොත්තු හා අවශ්‍යතාවන් ද නියෝජනය නො කරයි. එහෙත්, ඕස්ට්‍රේලියානු ආන්ඩුවේ දෑස් හමුවේ අල්කැටිරිගේ මූලික පාපය වූයේ ඔහු ටිමෝර මුහුදේ දැවැන්ත තෙල් හා ගෑස් නිධි පිලිබඳව සාකච්ඡා කල යුතු බව කියා සිටි කැන්බරාහි ඉල්ලීම්වලට වහා ම නතු නො වීම යි. ඒ සමග ම ඔහු, විශේෂයෙන් ම පැරනි විජිත බලවතා වන පෘතුගාලය වැනි අනෙකුත් තැන්වලින් ආර්ථික හා දේශපාලන සහයෝගය සොයමින් සිටියේ ය.

ආරම්භයේ පටන් ම, හොවාර්ඩ් ආන්ඩුවේ මිලිටරි මැදිහත් වීම මෙහෙය වුනේ නැගෙනහිර ටිමෝර වාසීන්ට උදව් කිරීමට වඩා, විශේෂයෙන් ම දිවයිනෙහි එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරීත්වය හීන වී යෑමට පටන් ගත් තැන් සිට, සිය යුරෝපා හා ආසියානු ප්‍රතිවාදීන්ට පෙර නැගෙනහිර ටිමෝරය තුලට කා වැදීමේ ඕස්ට්‍රේලියානු උත්සුකතාවන් මගිනි. වැටුප් හා සේවා කොන්දේසි අරබයා වැඩ වර්ජනය කල 600ක් පමන සොල්දාදුවන් අල් කැටිරි විසින් මාර්තු මාසයේ දී නෙරපා හරිනු ලැබීමෙන් පසුව දේශපාලන ආතතීන් කැපී පෙනෙන පරිදි තියුනු විය. අප්‍රේල් 28 දින, ආන්ඩුවට පක්ෂපාතී පොලීසිය ඩිල් හි ''කාරලිකාර''

සොල්දාදුවන්ට හා රැකියා නැති තරුනයන්ගේ විරෝධතාවට වෙඩි තැබීමෙන් අඩු ම තරමින් හය දෙනෙකු මිය ගොස් බොහෝ දෙනෙක් තුවාල ලැබූහ.

නැගෙනහිර ටිමෝරයේ ආරක්ෂක හමුදාවන් තුල, කන්ඩායමික ගැටුම් ඇවිලවීමේ මූලික ක්‍රියා කලාපයක් ඉටු කලේ ඕස්ට්‍රේලියාවේ හිටපු පිටුවාහලෙකු වූ එහි ජාතික ආරක්ෂක ඇකඩමියේ පුහුනුව ලත්, මේජර් ඇල්ෆ්‍රඩෝ රෙනාඩෝ යන කැරලි නායකයා ලෙස ඉස්මතු වූ අප්‍රකට චරිතයක් විසිනි. ආන්ඩුවට පක්ෂ හා කැරලිකාර හමුදාවන් අතර ගැටුම් උත්සන්න වෙත් ම හොවාර්ඩ් ආන්ඩුව බුෂ් පරිපාලනයේ ද පිටුබලය සහිතව මැයි 12 දා ටිමෝර මුහුද වෙත යුද නැව් දෙකක් හා හමුදාවක් පිටත් කර හැරීමට දිග හැරෙන ගැටුම යොදා ගත්තේ අල්කැටිරි ආන්ඩුවට දැනුම් දීමක් පවා නො කර ය.

නැගෙනහිර ටිමෝර ආන්ඩුවට සහාය පිනිස පැරාමිලිටරි පොලීසිය යැවීම ගැන සලකා බලමින් සිටි පෘතුගාලය විශේෂිත වූ අනෙකුත් බලවතුන්ගේ මැදිහත් වීම වැලැක්වීම මැයි 17 සිට 19 දක්වා හා අල්කැටිරිගේ නායකත්වය කෙරේ අභියෝගය වැඩි වෙමින් පැවති පාලක ෆ්‍රෙටිලින් කොන්ග්‍රසයට බලපෑම් දැමීම යන අරමුනු දෙක ම කැන්බරාවට තිබුනි.

නායකත්ව අභියෝගය බිඳ වැටීමත් සමග ඕස්ට්‍රේලියානු සූදානම ඉහලට ම නැගුනි. කැන්බරාවේ මෙන් ම ගුස්මාවෝ හා විදේශ ඇමති රාමෝස් හෝත්‍රාගේ බල කිරීම යටතේ හමුදා යෙදවීම සඳහා ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, මැලේසියාව හා පෘතුගාලයට විධිමත් ලෙස ආරාධනය කිරීමට සහාය දැක්වීම සඳහා අවසානයේ දී මැයි 24 දින අල්කැටිරි එකඟ විය.

මැදිහත් වීමේ පරිමාව හා නීතිරීති පිලිබඳ අවසන් එකඟතාවට පැමිනෙන තෙක් හෝ ප්‍රමාද නො වූ හොවාර්ඩ් මැයි 25 දින මිලිටරි මෙහෙයුම ''පූර්න ශක්තියෙන් ඉදිරියට'' යා යුතු යැයි නියෝග කලේ ය. දින ගනනාවක් ඇතුලත ඕස්ට්‍රේලියානු මෙන් ම එමින් සිටි මැලේසියානු හා නවසීලන්ත හමුදාවන්ගේ සම්පූර්න සුභාශිංසනය එහි ලඟා විය. යුද නැව් ඩිලී වරායේ නැංගුරම් ලූ අතර බ්ලැක් හෝක් හෙලිකොප්ටර් යානා ඉහල අහසේ පියාසර කලේ ය.

## ''නිදහසේ " රැවටිල්ල

ඉන්දුනීසියාවෙන් ''නිදහස'' ලත් අර්ධ දිවයින නැගෙනහිර ටිමෝර වාසීන් සඳහා සාමයේ, ප්‍රජාතන්ත්‍රවාදයේ හා සෞභාග්‍යයේ නව අවධියක් පෙරටු කර ගෙන ඇතැ යි 1999 දී කලා වූ උතුරා ගිය සියලු ආත්ම වංචනික ප්‍රකාශයන්ගේ අභූත ස්වභාවය නැගෙනහිර ටිමෝරයේ මිලිටරි ග්‍රහනය මගින් හෙලිදරව් කෙරෙයි. භූගෝලීකෘත නිෂ්පාදනයේ යුගය තුල, ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි මූල්‍යායතනවලින් ද මහා ව්‍යාපාරයන්ගෙන් හෝ විවිධ ගෝලීය හා කලාපීය බලවතුන්ගෙන් ද කුඩා රාජ්‍ය කැබැල්ලකට කවර කලෙක වත් ''නිදහස්'' විය නොහැකි ය.

1975 දී සුහර්තෝ ආඥාදායකත්වය විසින් පැරනි පෘතුගාල කොලනිය ආක්‍රමනය කරනු ලැබීමෙන් පසුව, නැගෙනහිර ටිමෝරවාසීන්, ගනන් බලා ඇති පරිදි ජීවිත 200,000ක් බිලි ගත් දිරිමත් අරගලයක් ඉන්දුනීසියානු මර්දනයට එරෙහිව ගෙන ගොස් ඇත. කෙසේ වුව ද ගුස්මාවෝ වැනි නැගෙනහිර ටිමෝර නායකයන් විසින් වගාදිගා කෙරුනු, හා ජාත්‍යන්තරවත් ඕස්ට්‍රේලියාවේත් මධ්‍යම පන්තික රැඩිකලුන් සටන් වැදූනු, නිදහසේ ඉදිරි දර්ශනය, අවෘත අන්තයක් බව සනාථ විය. ජාකර්තාහි මිලිටරි ජුන්ටාවට එරෙහිව නැගෙනහිර ටිමෝරයේ වැඩ කරන ජනතාවගේ හා ඉන්දුනීසියානු කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලයක් එමගින් වලකනු ලැබූ අතර, 1999 දී එය කලාපීය බලාධිකාරය හා ආධිපත්‍යය සඳහා එකිනෙකා සමග තරග වැදි ඕස්ට්‍රේලියාව හා පෘතුගාලයේ අත් ශක්තිමත් කලේ ය.

ඕස්ට්‍රේලියාවේ බලයට පත් සභාග හා කම්කරු ආන්ඩු 1975 දී සුහර්තෝගේ පවරා ගැනීමට පිටුබලය දුන් අතර, 1978 දී ටිමෝර මුහුදේ තෙල් හා ගෑස්වල පාලනය ලබා ගැනීමට හිලව් වශයෙන් ඉන්දුනීසියාව නැගෙනහිර ටිමෝරය ඈඳ ගැනීම නිල වශයෙන් පිලිගත් ලෝකයේ ප්‍රථම රට බවට ඕස්ට්‍රේලියාව පත් විය. 1998 දී සුහර්තෝ ඇදවැටීමෙන් පසුව පවා, හොවාර්ඩ් ආන්ඩුව නැගෙනහිර ටිමෝරයේ ජනමත විචාරනයක් සඳහා ඉල්ලීම් මැඩීමේ ජකර්තාවේ උත්සාහයන්ට දිගට ම සහාය දැක්වී ය.

කැන්බරාව සිය පිලිවෙත මාරු කලේ, යුරෝපා සංගමයේ පිටුබලය සහිතව පෘතුගාලය ජනමත විමසුමක් සඳහා එක්සත් ජාතීන්ගේ සහාය ගොනු කර ගෙන ඇති බව පැහැදිලි වීමට පටන් ගැනීමෙන් පසුව පමනි. ඕස්ට්‍රේලියාව ජකර්තාව සමග ඇති කර ගත් ටිමෝර් ගැප් ගිවිසුම යටතේ, එහි තෙල් හා ගෑස් හිමිකම් පෘතුගාලයේ අනුග්‍රහය සහිත ''නිදහස්'' නැගෙනහිර ටිමෝරය විසින් නො තකා හැරීමේ සැබෑ හැකියාව මෙයින් එලිමහනට පැමිනියේ ය. වොෂින්ටන්හි ක්ලින්ටන් පරිපාලනයේ සහයෝගය ඇතිව, හොවාඩ් ආන්ඩුව වියට්නාම් යුද්ධයෙන් පසුව එහි විශාලතම විදේශ මිලිටරි මෙහෙයුම දියත් කලේ ය.

1999 සැප්තැම්බර් මැදිහත් වීම, විශේෂයෙන් ම ඉරාකයට එරෙහිව 1990-91 දී එක්සත් ජනපදය මෙහෙයවූ පලමු ගල්ෆ් යුද්ධය මගින් සලකුනු කල සීතල යුද්ධයේ අවසානයෙන් පසුව වැඩෙන අන්තර්

අධිරාජ්‍යවාදී පසමිතුරුකම්වලින් අවුලුවන ලද මිලිටරිවාදයේ නව යුගයෙහි කොටසක් විය. යන්තම් මාස කිහිපයකට පෙර, හොවාඩ් සර්බියාවට එරෙහි නේටෝවේ යුද්ධය තම සංඥාව ලෙස ගත්තේ ය. එහි දී එක්සත් ජනපද ජනාධිපති බිල් ක්ලින්ටන් හා බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර්, පැරනි යුගෝස්ලාවියාවේ ජාතික ස්වෛරීත්වය පාගා දැමීම සඳහා සුජාතකරනය ලෙස ''අසදුචාරවත් අධිරාජ්‍යවාදයේ'' ප්‍රදර්ශන පතාකය දිග හලේ ය. එක්සත් ජනපදය හා එහි යුරෝපා සගයන්, කොසෝවෝ ප්‍රාන්තය සයිබීරියාවෙන් කපා වෙන් කිරීම සඳහා ගෙන ගිය කොල්ලකාරී යුද්ධය පිටුපස මහජන මතය ගලතා ගැනීමට කොසෝවා ඇල්බේනියානුවන් සංහාරය හා විලෝපනය පිලිබඳ තුච්ඡ බේගල් යොදා ගත්තෝ ය. නැහෙනහිර ටිමෝරයේ දී හොවාර්ඩ් ආන්ඩුව ක්ලින්ටන් පරිපාලනයේ පිටුබලය ද එක්සත් ජාතීන්ගේ සහයෝගය නමැති ආවරනය ද ඇතිව, නැගෙනහිර ටිමෝර වැසියන්ගේ ''ආරක්ෂාව'' නමැති ව්‍යාජ මුවාව යටතේ නිදහසේ ජනමත විමසුමෙන් පසුව ඉන්දුනීසියාවේ සහාය ලත් සන්නද්ධ කන්ඩායම් විසින් සිදු කෙරුනු භීෂනය, ගසා කෑවේ ය.

නැගෙනහිර ටිමෝරයේ ''විමුක්තිදායකයා'' ලෙස පෙනී යන හොවාඩ්ට හැකි වූයේ ලේබර් පක්ෂය ද හරිතයන් ද ඇතුලත් සමස්ත ඕස්ට්‍රේලියානු දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතයේ උද්වේගකර සහයෝගය මත මුලුමනින් ම පදනම් වී ගෙන ය. නේටෝවේ යුද්ධයෙහි දී මෙන් ම නැගෙනහිර ටිමෝරයට කල ඕස්ට්‍රේලියානු මැදිහත් වීමේ දී ද, ''හමුදාව යොදවනු'' වැනි පෙලපාලි සංවිධානය කරමින් හොවාර්ඩ්ට ඔහුගේ ආන්ඩුව ඒ වන විට මත් තීරනය කර තිබූ දෙය කිරීම සඳහා ''බලපෑම්'' දැමුවේ සෝෂාකාරී හුරේ දමන්නන් වූ විශේෂයෙන් ම ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී පක්ෂය හා එහි ග්‍රීන්ලෙෆ්ට් වීක්ලි පුවත් පත වැනි මධ්‍යම පන්තික රැඩිකලුන් ය.

ෆ්‍රෙටිලින් පක්ෂය මෙහෙයවූ ටිමෝර විරෝධතාවේ ජාතික සභාවේ (ඩීඑන්ආර්ටී) දේශපාලන බංකොලොත් භාවය ද මෙම මැදිහත් වීමෙන් හෙලිදරව් කෙරුනි. එහි ඉදිරි දර්ශනය අධිරාජ්‍යවාදයට එරෙහි අරගලයක් ගෙන යාම නො ව, තමන්ට පාලනය අත් කර ගතහැකි, ''ස්වාධීන'' ධනපති රාජ්‍යයක් ස්ථාපනය කිරීමට ප්‍රධාන බලවතුන් දිරි ගැන්වීම යි. 1999 දී ඉන්දුනීසියානු සන්නද්ධ කන්ඩායම්වල භීෂනයේ ඉහල ම අදියරේ දී ගුස්මාවෝ ඔහුගේ ෆැලින්ටිල් ගරිල්ලා භටයන්ට නියෝග කලේ ප්‍රතිප්‍රහාරවලින් වැලකී සිටින ලෙස යි. එමගින් බාධාවකින් තොරව ඝාතනයන් ගෙන යාමට ඉඩ සැලසුනි. සීඑන්ආර්ටී නායකයන් ගනන් බැලුවේ, අනාරක්ෂිත මිනිසුන් මරා දැමීමෙන් ඔවුන්ගේ ගම්මාන හා නගර විනාශ කිරීමේත් අනුරූ රැගත් විවෘත සිවිල් යුද්ධයේ දර්ශනවලින් බටහිර බලවතුන් ඇවිස්සෙනු ඇති බවටත් බටහිර මැදිහත් වීම සහතික කර ගැනීමට එය ආධාර වනු ඇති බවටත් ය.

නැගෙනහිර ටිමෝරයේ සියලු කටයුතු ගෙන යාමේ විජිතවාදී ආරක්ෂිත බලතල සහිත සංක්‍රමන පරිපාලනයක් ඒ තුල පිහිටුවා ලන ඕස්ට්‍රේලියානු මිලිටරි යටත් කිරීම, එක්සත් ජාතීන් අනුෂාංගනීය කලේ ය. ව්‍යවස්ථාදායක මන්ඩලයක් සඳහා පැවැත් වූ මැතිවරනය සංවිධානය කර අධීක්ෂනය කලේ එක්සත් ජාතීන්ගේ පරිපාලන සර්ගියෝ වියේරාඩි මෙලෝ විසිනි. ෆ්‍රෙටිලින් පක්ෂය ඉන් ජය ගත් අතර ජනාධිපති තනතුර සඳහා වූ ඡන්දයට ගුස්මාවෝ හා නාවික විරුද්ධවාදී අපේක්ෂකයෙක් ඉදිරිපත් වූහ. 2002 දී නිදහස ප්‍රකාශ කල විගස ම, ව්‍යවස්ථාදායක මන්ඩලය ආන්ඩුව පිහිටුවන බව ෆ්‍රෙටිලින් පක්ෂය නිවේදනය කල අතර අනෙකුත් මැතිවරන වසර 2007 දක්වා කල් දමනු ලැබී ය.

පවතින කන්ඩායම්ක හිංසනය කුහක ලෙස හෙලා දකින්නේ වී නමුත් හොවාර්ඩ් ආන්ඩුව නැගෙනහිර ටිමෝරයේ දේශපාලන හා සමාජ අර්බුදය සඳහා ඍජුව ම වගකිව යුතු ය. දේශපාලන නායක මෙසේ වත්මන් කල්ලිය ඔසවා තැබුවේ ඕස්ට්‍රේලියානු මිලිටරි මැදිහත්වීම ය. ''නව සහශ්‍රකයේ ප්‍රථම ජාතිය හා ලෝකයේ නව්‍යතම ප්‍රජාතන්ත්‍රවාදය'' ලෙස වර්නනා කරමින් 2002 නිදහස් සැමරුමට ප්‍රශස්ති ගැයූ අනෙකුන් ද සමග හොවාඩ් අත්වැල් බැඳ ගත්තේ ය. පසු ගිය පස් වසර තුල, ලෝකයේ අතිශය දුගී ජාතීන්ගෙන් එකක් වන නැගෙනහිර ටිමෝරයේ ශුභ සාධනය පිලිබඳව එය පල කල සියලු උත්සුකයන් තිබිය දී අනෙකුත් ආධාර දෙන රටවල් මෙන් ම කැන්බරාව ද සපයා ඇත්තේ සොච්චම් ආධාරයක් පමනි.

හොවාඩ් ආන්ඩුවේ ප්‍රමුඛ උත්සුකතාව බවට පත්ව තිබෙන්නේ ටිමෝර මුහුදේ තෙල් හා ගෑස්වල ලොකු ම පංගුව අත් කර ගැනීම ය. ඕස්ට්‍රේලියාව විසින් පිලිගැනීම ප්‍රතික්ෂේප කර ඇති ජාත්‍යන්තර දේශ සීමා නීතිය යටතේ මුහුදු පත්ලෙහි සම්පත්වලින් වැඩි කොටස සඳහා නැගෙනහිර ටිමෝරයට හිමිකම් ඇත. විධිමත් නිදහස් සැමරුමටත් පෙර ම ඕස්ට්‍රේලියානු ආන්ඩුව අගමැති ලෙස තේරී පත් වූ අල්කැටිරි ගුවනින් කැන්බරාවට ගෙන්වා ගත්තේ, මුහුදු පත්ලේ සම්පත්වලින් වැඩි කොටස ඕස්ට්‍රේලියාවට හිමි කර දෙන දේශ සීමා ගිවිසුම අත්පත් කිරීමට ඔහුට බල කිරීම සඳහා ය. ඔවුන් ඉන් පසු සාකච්ඡා හිතාමතා ම දිග්ගැස්වූයේ මුදල් හිඟයෙන් පෙලෙන නැගෙනහිර ටිමෝරයට බලා සිටීම කල නො හැකි දෙයක් බව හොඳකාරව ම දැන ගෙන ය.

පසු ගිය වසරේ කැන්බරාව නැගෙනහිර ටිමෝරයට අතිශයින් අවාසිදායක වන ගෑස් හා තෙල් බිම් බෙදා

ගැනීමේ ගිවිසුමකට හා මුහුදු සීමාවන් පිලිබඳ අවසන් එකඟතාව වසර 50කින් හෝ 60කින් ප්‍රමාද කිරීම සඳහා ඩිලී වෙත අවසන් වශයෙන් බල කලේ ය. ටිමෝර මුහුද යට තෙල් හා ගෑස් සංචිත, අඩු ම තරමින් එජ ඩොලර් බිලියන 30ක් බවට ගනන් බලා තිබේ. සංචිතවලින් තුනෙන් දෙකක් ම පිහිටා ඇත්තේ ඕස්ට්‍රේලියාවට වඩා නැගෙනහිර ටිමෝරයට සමීපව ය. එබැවින් ජාත්‍යන්තර නීතිය අනුව එය අයත් විය යුත්තේ ඩිලීයට ය. විශාලතම බිම වන ග්‍රේටර් සන්රයිඩ්හි ආදායමින් සියයට අසූවක් නැගෙනහිර ටිමෝරයට ලැබිය යුතු වුවත්, අවසාන ගිවිසුම යටතේ එය 50ට 50 ලෙස බෙදී යයි. සාකච්ඡා ඇදී යමින් තිබිය දී පවා කැන්බරාව, ලැමිනේරියා-කොරලිනා බිමෙන් අවුරුදු හයක් සඳහා රාජ්‍ය භාගය ලෙස බිලියනයක් සාක්කුවේ දාගත් අතර ඩිලියට කිසිවක් නො ලැබුනි. එනමුදු, ජාත්‍යන්තර නීතිය යොදා ගත්තේ නම් භූමි භාගය පිහිටා ඇත්තේ මුලුමනින් ම නැගෙනහිර ටිමෝර මුහුදේ ය.

උග්‍ර සමාජ ආතතීන් නැගෙනහිර ටිමෝරය තුල පැවතීම පුදුමයක් නො වේ. වංචනික නායකයන් විසින් ඒවා ගසා කනු ලබන අතර ''පෙරදිගයන්'' හා අපරදිගයන් අතර ගැටුම් නිර්මානය කෙරෙයි. ආධාර නමැති සාගින්නෙන් පෙලෙන, තෙල් හා ගෑස් ආදායමෙන් රවටනු ලැබූ නැගෙනහිර ටිමෝර ආන්ඩුවට ජනතාව මුහුන පා සිටින උග්‍ර ආර්ථික හා සමාජ ගැටලු කිසිවක් විසඳීමට මුලුමනින් ම නො සෑහෙන බිලියන 50ක පමන වාර්ෂික ආදායමක් උපයා ගැනීමට පමනක් හැකි වී තිබේ. ඩිලීහි වීදිවල රැකියා විරහිත තරුනයන්ගේ කල්ලි නැගී ඒමත්, කොල්ල කෑම හා තම ප්‍රතිවාදීන්ට එරෙහි පලි ගැනීමේ ප්‍රහාරයනුත්, ගුස්මාවෝ, හෝර්ටා හා අල්කටිරිගේ ප්‍රතිපත්තීන්හි පමනක් නො ව හොවාර්ඩ් හා ඔහුගේ ඇමතියන්ගේ ප්‍රතිපත්තීන්වල ද ප්‍රතිඵලය යි.

ඕස්ට්‍රේලියාව, කලාපීය රාජ්‍යාන්තර නායකයා ලෙස හොවාඩ් ආන්ඩුව, වර්තමාන මිලිටරි මැදිහත් වීම නැගෙනහිර ටිමෝරයේ වඩාත් ස්ථිර, නව විජිතවාදී ග්‍රහනයක් කරා පරිවර්තනය කිරීමට සූදානම් වන බවට දැනට මත් සලකුනු පවතියි. ඕස්ට්‍රේලියානු මාධ්‍ය සමපේක්ෂනය කරන්නේ හමුදාව, අඩුම තරමින් ලබන වසරේ මැතිවරනය තාක් රැඳී සිටිනු ඇති බව යි. විදේශ ඇමති ඇලෙක්සැන්ඩර් ඩව්නර් ඕස්ට්‍රේලියානු ගුවන් විදුලි සේවයට මැයි 29 දින ප්‍රකාශ කලේ, ඕස්ට්‍රේලියානු මිලිටරි මැදිහත් වීම නො වන්නට ''නැගෙනහිර ටිමෝරය අසාර්ථක රාජ්‍යයක් බවට පත් වීමේ අන්තරායට මුහුන පා සිටින'' බව යි.

1999 ආක්‍රමනයෙන් පසුව හොවාර්ඩ් අපකීර්තිමත් ලෙස යෝජනා කලේ, ආසියානු-පැසිෆික් කලාපය තුල එක්සත් ජනපදය වෙනුවෙන් ''නියෝජ්‍ය පොලිස්පති ලෙස ඕස්ට්‍රේලියාව කටයුතු කල යුතු බව යි. කලාපීය නායකයන්ගේ කෝපය පල වීමෙන් පසුව ඔහුත තම ප්‍රකාශයන්ගෙන් පසු බා සිටි නමුත්, සලකුනු වී ඇති මූලෝපායෙන් කිසි විටෙක ඉවත් නො වී ය. එනම් දෙවැනි හෝ තුන් වැනි ගනයේ බලවතෙකු ලෙස. ඕස්ට්‍රේලියාවට සිය ප්‍රතිවාදීන්ට මුහුන දිය හැක්කේත් කලාපය තුල සිය අවශ්‍යතාවන් ආරක්ෂා කර ගත හැක්කේත් එක්සත් ජනපදයේ පිටුබලය සහිතව ය. කැන්බරාව, බුෂ් පරිපාලනයේ බොරුකාර ''ත්‍රස්තයට එරෙහි යුද්ධයට'' සහයෝගය දීමේ දීත් 2003 දී එක්සත් ජනපදය මෙහෙය වූ නීති විරෝධී ඉරාකය යටත් කිරීමේ දී ඊට හවුල් වීමේ දීත්, එහි අරමුනු වූයේ ආසන්න ප්‍රදේශය තුල තමාගේ ම නව විජිතවාදී මදාවියට හරියට ම එක්සත් ජනපදයේ සහයෝගය ගොනු කර ගැනීම ය

ඉරාක ආක්‍රමනයෙන් මාස කිහිපයක් තුල, හොවාඩ් ආන්ඩුව, සොලමන් දූපත් ''අසාර්ථක රාජ්‍යයක්'' ලෙස හංවඩු ගැසුවේ, එය ජාත්‍යන්තර අපරාධකරුවන්ගේ ද මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ හා ත්‍රස්තවාදීන්ගේ ද පාරාදීසයක් බවට පත් වෙමින් තිබෙන බව අශික්ෂිත ලෙස ප්‍රකාශ කරමිනි. පසුව තමන්ගේ ම ''පූර්වභංග'' ක්‍රියාන්විතය දියත් කලේ ය. 2003 ජූලි මාසයේ දී ඕස්ට්‍රේලියාව මෙහෙය වූ හමුදා භටයන්, පොලීසිය හා නිලධාරීන්ගෙන් සැදුම් ලත් කාර්‍ය සාධක බලකායක් හොනියාරාවට ගොඩ බැස්සේ ය. සොලමන්ස් දූපත්හි කලාපීය ආධාරක දූත මෙහෙවර නම් වූ මෙය, කුඩා පැසිෆික් දූපත් රාජ්‍ය බලයේ සෑම ලීවරයක් ම පාලනය සියතට ගත්තේ අඩු ම තරමින් දශකයක් වත් එහි රැඳී සිටීමේ අදහස ඇතිව ය. නවතම ටිමෝර මැදිහත් වීමෙන් යන්තම් සති ගනනකට පෙර හොවාඩ් ආන්ඩුව, 300කට වැඩි හමුදා හා පොලිස් භටයන් සොලමන් දූපත්වලට පිටත් කලේ, ඕස්ට්‍රේලියානු යටත් කිරීමට දේශීය වශයෙන් නැගී එන විරෝධය හා සතුරුකම් මධ්‍යයේ දූත මෙහෙවර නගා සිටුවීමට ය.

ඕස්ට්‍රේලියාව-නැගෙනහිර ටිමෝරයේ ජාතික ස්වෛරී භාවයට ''ගරු කරන්නේ'' ය යන මිථ්‍යාව පවත්වා ගැනීමට උත්සාහ කරන අතර ම, හොවාර්ඩ් දැනට මත් ඇඟවුම් කර ඇත්තේ දූත මෙහෙවර වර්ගයේ ක්‍රියාන්විතයක් සලකා බැලෙමින් ඇති බව යි. මැයි 28 දින ඕස්ට්‍රේලියානු ඒබීසී රූපවාහිනිය ඩිලිහි එවැනි ම දිගු කාලීන රැඳී සිටීමක් ගැන විමසූ කල ඔහු කීවේ ''මම කිසිවක් බැහැර නොකරමි'' යන්න යි.

සොලමන් දූපත් හා නැගෙනහිර ටිමෝරයට කල ඕස්ට්‍රේලියානු මැදිහත් වීම් කලාපය තුල උග්‍ර වෙමින් ඇති අන්තර් අධිරාජ්‍යවාදී පසමිතුරුකම් පිලිබඳ ඇඟවීමකි. හොවාර්ඩ් ''අපගේ පිලිකන්න'' ලෙස හැඳින්වූ ප්‍රදේශයේ වර්ධනය වන ආර්ථික හා මූලෝපායික අභියෝගයන්ට ඔහුගේ ප්‍රතිචාරය,

ඕස්ට්‍රේලියාවෙන් උතුරෙහි ''අස්ථාවරත්වයේ චාපය'' පුරා මිලිටරි කඳවුරු ගොඩ නැගීම යි. නැගෙනහිර ටිමෝර මැදිහත් වීම පිලිබඳව මැයි 25 දින පාර්ලිමේන්තුවට කල ඔහුගේ කතාව තුල අගමැති අවධාරනය කලේ ''අපගේ කලාපය තුල ස්ථාවරත්වය ගොඩ නැගීමේ හා පවත්වා ගෙන යාමේ වැදගත් ජාතික අවශ්‍යතාවක් ඕස්ට්‍රේලියාවට තිබෙන'' බව යි.

මර්ඩොක්ගේ ඕස්ට්‍රේලියානු පුවත් පතෙහි මැයි 31 දින ''බලය ප්‍රදර්ශනය කිරීමක්'' යන හිසින් වූ ප්‍රකාශයක් තුල නිදැල්ලේ යන සංස්කාරක පෝල් කෙලී එක එල්ලේ කියා සිටියේ ඕස්ට්‍රේලියාව නැගෙනහිර ටිමෝරය තුල පමනක් නො ව කලාපය පුරා ම, රාජ්‍යන්තර නායක ක්‍රියා කලාපය ඉටු කල යුතු බව යි. හොවාර්ඩ්ගේ ''මධ්‍යස්ථ භාවය'' පිලිබඳ මවා පෑම පසෙකට විසිකර දැමූ ඔහු පෙන්වා දුන්නේ, කැන්බරාව දැනට මත් නැගෙනහිර ටිමෝරයේ දේශපාලන කටයුතු තීරනය කරන ආකාරයට සමාන ලෙස අනෙකුත් රටවල ද කටයුතු කල යුතු බව යි.

''එම අර්ථයෙන් ඕස්ට්‍රේලියාව, කලාපීය බලවතෙකු හෝ විභව රාජ්‍යාන්තර නායකයෙක් ලෙස ආරක්ෂාව හා දේශපාලන ප්‍රතිවිපාකයන් හැඩ ගස්වයි. මෙම භාෂාව බොහෝ දෙනෙකුට දිරවන්නේ නැත. එහෙත් යථාර්ථය එය යි. ඕස්ට්‍රේලියාවට එය නව අත්හදා බැලීමේ ක්ෂේත්‍රයකි. අප කලාපීය බලවතෙකු බවට පත් වෙමින් සිටින අතර එම බලය ක්‍රියාවේ යෙදීමෙහි ප්‍රතිලාභ හා අවදානම් හඳුනා ගනිමින් සිටිමු. අප නැගෙනහිර ටිමෝරයේ නීතියේ හා සාමයේ සම්පූර්න බලය අතට ගෙන සිටින අතර එහි දේශීය බල අරගලය කෙරී ගෙන යන්නේ අපගේ බලපෑමෙහි පසුබිමට එරෙහිව යි,'' ඔහු ප්‍රකාශ කලේ ය.

කෙලීගේ ප්‍රකාශය, ආසියා-පැසිෆික් කලාපය පුරා තවත් මිලිටරි මැදිහත් වීම් සඳහා සූදානම් වීම පිලිබඳව පාලක කවයන් තුල කෙරෙන පුලුල් සාකච්ඡාවක කොටසකි. හිටපු ප්‍රධාන ආරක්ෂක නිලධාරියෙක් වන පෝල් ඩිබ් මැයි 16 දින ඕස්ට්‍රේලියන් පුවත් පතට ලියා ඇත්තේ, ''මෑතක දී ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සගයෙකු මා හට පැවසූ පරිදි අස්ථාවරත්වයේ චාපය 'නිසැකව ම අපාය මෙන් කකියයි.' නැගෙනහිර ටිමෝරය, සොලමන් දූපත්, පැපුවා නිව් ගිනියා, වනුවාටු හා ෆීජිහි පෙනුම ගැන ඉන්දුනීසියාවේ පැපුවා ප්‍රාන්තයේ අස්ථාවරත්වයේ සලකුනු පසෙක තැබුවත්, සෑහීමකට පත් විය නොහැකි ය. අප දිගු කලක් තිස්සේ දැක ඇත්තේ, ලෝකයේ මෙම කොටසෙහි අපගේ අවශ්‍යතාවන් ගැන වෙනත් කිසිවෙකු හෝ උනන්දු නොවන බව යි. ජෝන් හොවාර්ඩ් නිරීක්ෂනය කරන පරිදි මූලිකත්වය ගැනීම අපගේ වගකීම වන අතර අනෙකුත් මිනිස්සු, එනම් එක්සත් ජනපද මිතුරා ද ඇතුලු, අප එසේ කල යුතු යයි කල්පනා කරති.''

ඕස්ට්‍රේලියානු මිලිටරිවාදයේ මෙම පුපුරා හැලීම නැගෙනහිර ටිමෝරයේ, සොලමන් දූපත්හි හා කලාපයේ අනෙකුත් කොටස්වල වැඩ කරන ජනතාව හමුවේ පමනක් නො ව, නො වැලැක්විය හැකි පරිදි ම මෙම මිලිටරි මදාවියේ බර දරා සිටීමට බල කෙරී ඇති ඕස්ට්‍රේලියානු කම්කරුවන් හමුවේ ද බරපතල අන්තරායයන් මතු කරයි. ඕස්ට්‍රේලියානු බල ඇනි, මැද පෙරදිගට, මධ්‍යම ආසියාවට හා පැසිෆික් ප්‍රදේශවලට පිටත් කර හැරීම, දිගු කලක් භුක්ති විඳි ප්‍රජාතාන්ත්‍රීය හා සිවිල් අයිතීන්ට පෙර නො වූ විරූ ලෙස පහර දීම සමග එකට බැඳී තිබේ. ආසියානු පැසිෆික් කලාපය පුරා විජිතවාදී කඳවුරු පිහිටුවීම සියල්ලටත් වඩා ආන්ඩුවේ ප්‍රතිපත්තීන්ට රට තුලින් නැගෙන විරුද්ධත්වය මැඩීම ඉලක්ක කර ගත් පොලිස් රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම අත්දකිමින් සිටියි. ඕස්ට්‍රේලියාවේ ද ජාත්‍යන්තරව ද කම්කරුවන්, හොවාර්ඩ් ආන්ඩුවේ කොල්ලකාරී සැලසුම්වලට විරුද්ධ විය යුතු අතර, නැගෙනහිර ටිමෝරයෙන් ද සොලමන් දූපත්වලින් ද සියලු විදේශ හමුදා හා පොලිස් භටයන් වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් කර ගැනීමට බල කල යුතු ය.

නැගෙනහිර ටිමෝර කම්කරුවන්, ගැමියන් හා තරුනයන්, පසු ගිය හත් වසරේ ඔවුන්ගේ අත්දැකීම්වලින් නිශ්චිත දේශපාලන නිගමන උකහා ගත යුතු ය. ප්‍රධාන බලවතුන්ගේ හා ගෝලීය ප්‍රාග්ධනයේ ආධිපත්‍යය යටතේ ''නිදහස'' යන්නෙන් ගෙන එනු ඇත්තේ අන් කිසිවක් නො ව ගැඹුරු වන සමාජ කාලකන්නිකම හා මූලික ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් මත ප්‍රහාරයන් ය. බෙදුම්වාදයේ භේදකාරී තර්කනය, ඩිලී හි වීදිවල හට ගෙන ඇති භාතෘභාරක ගැටුම් තුල දැක ගත හැකි ය. එක ම ප්‍රගතිශීලී විසඳුම වන්නේ නැගෙනහිර ටිමෝර ජනතාව අසල්වැසි ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව හා කලාපය ද ලෝකය ද පුරා සිටින සිය පන්ති සහෝදරයන් හා සහෝදරියන් සමග සමාජවාදී ක්‍රියා මාර්ගයක පදනම මත ඒකාබද්ධ කිරීම යි. ගෝලීය ප්‍රාග්ධනයේ හා අධිරාජ්‍යවාදයේ ආධිපත්‍යය අවසාන කිරීම මගින් පමනක්, මෙම රටවල, අතිමහත් බහුතරයක් ජනතාවට අත් කර දී තිබෙන බිහිසුනු දුගී භාවය නිමා කිරීමට බෙහෙවින් අත්‍යවශ්‍ය සම්පත් ලබා ගත හැකිය.

© www.wsws.org